සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

හෙද පුහුණු පාඨමාලාව සඳහා සිසුන් බඳවා ගැනීම - 2025

විද්‍යුත් අයදුම්පත සම්පූර්ණ කිරීම සඳහා උපදෙස්

1. අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර ගැසට් නිවේදනය සහ මෙම උපදෙස් පත්‍රිකාවේ සඳහන් සියලු කරුණු ඉතා හොඳින් කියවන්න.

2. අයදුම්පත් ඉදිරිපත් කල යුත්තේ සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ www.health@gov.lk නිළ වෙබ් අඩවිය ඔස්සේ පමණි.

3. මේ සඳහා සුදුසුකම් ලබන්නේ 2020 වර්ෂයේ (පැරණි නිර්දේශය) හෝ 2020 වර්ෂයේ (නව නිර්දේශය) හෝ 2021 වර්ෂයේ හෝ 2022 වර්ෂයේ හෝ යන විභාග වලින් එකකදී ජීව විද්‍යා සහ භෞතික විද්‍යා විෂය ධාරාවන්ගෙන් අ.පො.ස. (උ.පෙළ) විභාගය සමත් වූවන් පමණි. ( වැඩිදුර තොරතුරු ගැසට් නිවේදනයේ ඡේද අංක 02. යටතේ දැක්වෙන අංක 01 වගුවේ සඳහන් වේ.)

4. අයදුම්පත් කැඳවීමේ අවසාන දිනය 2025.08.12 වේ.

5. එක් අයදුම්කරුවෙකුට ඉදිරිපත් කල හැක්කේ එක් අයදුම්පතක් පමණි. (ගැසට් නිවේදනයේ 1.1. ඡේදය බලන්න.)

6. රුපියල් 1000/- මුදල ගෙවීම අන්තර්ජාල බැංකු සේවා හෝ මුදල් තැම්පත් කිරීමේ යන්ත්‍ර මගින් **සිදු නොකල යුතුය.**

7. සෑම අයදුම්කරුවෙකුම තම අයදුම්පත ඉදිරිපත් කිරීමට පෙර ලංකා බැංකු ශාඛාවකට ගොස් රු.1000/- ක මුදල ගෙවිය යුතුය. ඒ සඳහා බැංකුවෙන් ලැබෙන **රිසිට් පතේ මුද්‍රණය වී ඇති අංකය අයදුම්පතේ නියමිත ස්ථානයට ඇතුලත් කිරීමෙන් පසුව පමණක් අයදුම්පත යොමුකල යුතුය.** එසේ නොකරන එනම්, අයදුම්පත ඉදිරිපත් කල පසු මුදල් ගෙවා ඇති සහ මුදල් නොගෙවා අයදුම්පත් ඉදිරිපත් කර ඇති සියලු අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. (ගැසට් නිවේදනයේ 1.4. සහ 6.3. ඡේද බලන්න.)

8. අයදුම්පත විධිමත් පරිදි ඉදිරිපත් කල වහාම ලැබෙන එහි පිටපත සෑම අයදුම්කරුවෙකු විසින්ම අනිවාර්යයෙන්ම භාගත කර ගත යුතු අතර (Print out) අංක 05 කින් යුත් කේතයද සුරක්ෂිතව තබාගත යුතුය. එලෙස අයදුම්පතෙහි පිටපතක් සහ අංක 05 කින් යුත් කේතයක් නොලැබෙන අයදුම්කරුවන් නොපමාව මානව සම්පත් කළමනාකරණ හා සම්බන්ධීකරණ අංශය අමතන්න. (ගැසට් නිවේදනයේ 6.4. ඡේදයෙහි (අ) සිට (ඇ) දක්වා වූ අනුඡේද සහ 6.5. (අ) අනුඡේදය බලන්න.)

9. පහත සඳහන් නුසුදුසුකම් පවතින සිසුන් මේ සඳහා අයදුම් නොකල යුතුය.( ගැසට් නිවේදනයේ 1.2. අනුඡේදය සහ 5. ඡේදයේ 5.1 සිට 5.5 දක්වා සඳහන් අනුඡේද බලන්න.)

(අ). විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ පවත්නා රජයේ විශ්වවිද්‍යාලයක, රජයේ විශ්වවිද්‍යාල විද්‍යායතනයක උසස් පෙළ සුදුසකම් වලින් බඳවාගනු ලබන උපාධි පාඨමාලාවක් හැදෑරීම සඳහා රජයේ නිදහස් අධ්‍යාපන වරප්‍රසාද යටතේ අභ්‍යන්තර ශිෂ්‍යයෙකු ලෙස ලියාපදිංචි වී සිටින / හදාරමින් සිටින සිසුන්

(ආ). ජාතික අධ්‍යාපන විද්‍යා පීඨ, සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය අතුලු වෙනත් රජයේ ආයතන වල උසස් පෙළ ප්‍රතිඵල මත බඳවාගනු ලබන පූර්ණ කාලීන පාඨමාලාවක ලියාපදංචි සිටින /හදාරමින් සිටින සිසුන්

විශේෂඥ වෛද්‍ය ඩබ්ලිව්.කේ. වික්‍රමසිංහ
අතිරේක ලේකම් (වෛද්‍ය සේවා)
සෞඛ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
කොළඹ 10.

**10.** කිසිදු අයදුම්කරුවෙකු තම මාර්ගගත අයදුම්පතට ව්‍යාජ තොරතුරු ඇතුලත් නොකල යුතුය. (ගැසට් නිවේදනයේ 1.3. ඡේදය බලන්න.)

**11.** ජංගම දුරකථන අංකයක් ඇතුලත් කල යුතුය. අයදුම්කරුට තමාගේ සහ පියාගේ/මවගේ/භාරකරුගේ ජංගම දුරකථන අංකයද ඇතුලත් කල හැකිය.

**12.** අයදුම්පත් ඉදිරිපත් කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කිරීම සඳහා අයදුම්කරු සතුව තිබිය යුතු ලේඛන හා තොරතුරු. (ගැසට් නිවේදනයේ 1.4. ඡේදය බලන්න.)

- ජාතික හැඳුනුම්පත
- ඔබගේ උස (සෙ.මී) වලින් දැක්විය යුතුය
- අ.පො.ස. (සා.පෙළ) / (උ.පෙළ) සහතිකපත් සහ **Z** අගය දැක්වෙන ලේඛනය
- ඇමතුම් ලබාදියහැකි ජංගම දුරකථන අංක දෙකක්
  - රු. 1000/- ක ගාස්තුව ගෙවූ බවට <u>බැංකුවෙන් ලද රිසිට්පත</u> (ගැසට් පත්‍රයේ 6.3. ඡේදය බලන්න)

13. **අන්තර්ජාලය හරහා අයදුම්පත සම්පූර්ණ කිරීමේදී සැලකිය යුතු කරුණු ;**

(අ). අයදුම්පත සම්පූර්ණ කල යුත්තේ ඉංග්‍රීසි භාෂාවෙන් පමණි.

(ආ). අ.පො.ස.(උ.පෙළ) විභාගයේදී යොදාගත් ජාතික හැඳුනුම්පත් අංකයම භාවිතා කල යුතුය.

(ඇ). අදාල විභාග අංක ඇතුලත් කල පසු අ.පො.ස. (උ.පෙළ) සහ අ.පො.ස.(සා.පෙළ) විභාග ප්‍රතිඵල ස්වයංක්‍රියව උත්පාදනය වේ. කෙසේ වෙතත්, එම ප්‍රතිඵලවල කිසියම් වෙනසක් තිබේ නම්, ඔබ සතුව ඇති ප්‍රතිඵල ලේඛණයේ සඳහන් ප්‍රතිඵල අයදුම්පතෙහි ඊට පහලින් ඇති කොටසෙහි සඳහන් කල යුතුය.

14. **අත්‍යාවශ්‍ය තොරතුරු දැනගැනීම සඳහා විමසීම්**

මෙම පාඨමාලා සඳහා අයදුම්කිරීමට සියළු සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් අයදුම්පත සම්පූර්ණ කිරීමේදී කිසියම් ගැටලුවක් ඇති වුව හොත් ඒ සම්බන්ධයෙන් තාක්ෂණික සහාය ලබාගැනීම සඳහා හෝ ඉහත ගැසට් නිවේදනයේ 6.4. (ඇ). ඡේදයේ දැක්වෙන ගැටලුවක් නිරාකරණය කර ගැනීම සඳහා පමණක් සතියේ වැඩකරන දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 4.00 දක්වා කාලය තුල සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ මානව සම්පත් කළමනාකරණ හා සම්බන්ධීකරණ ඒකකයේ දුරකථන අංක 0112 340 007 අමතන්න. hrcodmoh@gmail.com විද්‍යුත් තැපැල් ලිපිනයෙන්ද සම්බන්ධ විය හැකිය. **<u>(විද්‍යුත් තැපැල ඔස්සේ සම්බන්ධ වන සැමවිටම එහි ඔබගේ ජාතික හැඳුනුම්පත් අංකය සහ දුරකථන අංකයක් සඳහන් කිරීම අනිවාර්ය වේ.)</u>**

<u>වෙනත් කරුණු පිළිබඳව විමසා ඇමතුම් ලබාදීමෙන් වලකින්න.</u>

**15.** ගැසට් නිවේදනයේ 8.1. ඡේදය අනුව සම්මුඛ පරීක්ෂණය පැවැත්වීමෙන් පසු තෝරාගත් අයදුම්කරුවන් පිළිබඳ තොරතුරු මෙම අමාත්‍යාංශයීය වෙබ් අඩවියේ පළකරනු ලබන අතර, කිසිවෙකුට පුද්ගලිකව දැනුම් දෙනු නොලැබේ.කෙසේ වෙතත්, අවස්ථානුකූලව පැනනගින විශේෂිත තොරතුරු පිළිබඳව දැනුවත් කිරීමට අවශ්‍ය වුවහොත් ඒවා ඔබ විසින් අයදුම්පත සමග ඉදිරිපත් කර ඇති දුරකථන අංක සහ විද්‍යුත් තැපැල් ලිපිනය ඔස්සේ සිදුකරනු ලැබේ. එබැවින්, අයදුම්පත සමග ඉදිරිපත් කරන ලද දුරකථන අංක සහ විද්‍යුත් තැපැල් ලිපිනය නොවෙනස්ව, සක්‍රියව තබාගැනීම ඔබගේ වගකීමක් වන අතර, එවායේ වෙනස්වීම් මත හෝ අක්‍රියව පැවතීම මත අදාල තොරතුරු නිසි කලට සංනිවේදනය නොවීම නිසා සිදුවිය හැකි ගැටලු සහගත තත්වයන් සම්බන්ධයෙන් මෙම අමාත්‍යාංශය වගකියනු නොලැබේ.

විශේෂඥ වෛද්‍ය ඩබ්ලිව්.කේ. වික්‍රමසිංහ
අතිරේක ලේකම් (වෛද්‍ය සේවා)
සෞඛ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
කොළඹ 10.